**කවරයේ කතාව**

# විශ්ව ගම්මානයට පාර කැපූ මාකෝනිගේ සියවස් පිම්ම



මාකෝනි ඔහුගේ සහායකයන් සමග නිව්ෆවුන්ඩ්ලන්තයේ සින්ගල්හිල් හි දී ඇන්ටෙනාව යැවීමට සරුංගලයක් ඉහළ නැංවූ මොහොත.

විශ්ව ගම්මානය බිහිකිරීම මුල්ම පස් පිඩැල්ල කැපුනේ හරියට මීට වසර 100 කට පෙර ය. ඒ ඉතාලි ජාතික ගුග්ලිඑල්මෝ මාකෝනි විසින් මුල්වරට අත්ලාන්තික් සාගරය හරහා ගුවන්විදුලි පණිවිඩයක් යැවීමෙන් පසුව ය. ලෝකය පුරා ගුවන්විදුලි පණිවිඩ හුවමාරුවේ ආරම්භය වූ එම ඓතිහාසික පියවර තබනු ලැබුවේ 1901 දෙසැම්බර් 12 වැනිද ය. එහි සියවස් සමරුව නිමිත්තෙන් එංගලන්තයේ කෝන්වෙල් පොල්ධූ හි දී විශේෂ කෞතුකාගාරයක් විවෘත කෙරිණ. 'මාකෝනි විසිටර් සෙන්ටර්' යනුවෙන් නම් කොට ඇති එම කෞතුකාගාරය මගින් ලොව පුරා නරඹන්නන්ට ඒ ඓතිහාසික සිදුවීම පිළිබඳ විස්තර දැක ගත හැකි ය.

මින් වසර 100 කට පෙර මාකෝනි ඒ ඓතිහාසික පණිවිඩය යැවූ වේලාවටම නැවතත් එම පණිවිඩය යැවීම සියවස් සමරු වැඩපිළිවෙළේ එක් අංගයක් විය. මේ වතාවේ එම පණිවිඩය යැවුයේ රාජකීය නාවුක හමුදාව මගිනි. එද මාකෝනි යැවූ මෝස් ක්‍රමයට ඉංග්‍රීසි 'එස්' අකුර සංකේතවත් කළ (තිත් තුන ...) පණිවිඩය අත්ලාන්තික් සාගරය හරහා සැ. 2000 ක් කි. මී. 3,200) දුර කැනඩාවේ නිව්ෆවුන්ඩ්ලන්තයේ සිග්නල් හිල් වෙත බ්‍රිතාන්‍යයේ සිට මෙවරත් යවනු ලැබීය. ඒ උළෙලට මාකෝනිගේ මුණුපුරා ද සහභාගි විය.

මාකෝනි සිය පණිවිඩය මුලින්ම යැවීමට උත්සාහ කලේ 11 වැනිද ය. එහෙත් ඒ උත්සාහය අසාර්ථක විය.

මාකෝනි මේ අත්හද බැලීම සඳහා කෝන්වෙල් හී සිටි තම කණ්ඩායම සම්බන්ධ කරගත්තේ අත්ලන්තික් සාගරය හරහා එලන ලද සබ්මැරින කේබලයක් මගිනි. කැනඩාවේ සිටි ඒ කණ්ඩායමට මාකෝනි එක්තරා වේලාවක් තුළ පණිවිඩයක් එවන ලෙස දැන්වීය.



පොලිධූ හී කෞතුකාගාරය හා සියවස් සමරු උළෙල පැවැත්වූ ස්ථානය.



ස්මාරකය

ඉතා දුර්වල පණිවිඩයක් නිව්ෆවුන්ඩ්ලන්තයට ලැබිණ. දැඩි සුළගක් හමා ගිය නිසා සිග්නල් හිල් අහසට නංවන ලද ඇන්ටනාව සහිත බැලූනය සුළගේ ගසා ගෙන ගියේ ය. ඒ නිසා මුල් දිනයේ අත්හද බැලීම නවතා දමනු ලැබීය. දෙවැනි දිනයේ එනම් 12 වැනිද යළිත් අත්හද බැලීම ආරම්භ කෙරිණ. එවර සරුංගලය මගින් නිවැරදිව තිත් තුන ඇතුළත් මෝස් සංඥාව ලබා ගත හැකි විය. මාකෝනි ඊළගට 'ආර්' අකුර සඳහා වූ තිත, ඉර, තිත සංඥාව යැවිය. (.-.) "කලින් දිනයේ රැහැන් රහිත පණිවිඩය නිසි ලෙස යැවීමට නොහැකි වූයේ පෘථිවියේ ගෝලාකාර බව නිසාද එසේ නැති නම් සුළගේ බාධාව නිසා ද" යන්න ඔවුනට මතුවූ ගැටලුව දෙවැනි දිනයේ සාර්ථක වීම නිසා මග හැරී ගිය බව මාකෝනි පසුව කීවේ ය. "හරියටම 12 වැනිද 12.30 ට මට ඒ පණිවිඩය නිවැරදිව ලැබුණා" මාකෝනි ඒ අවස්ථාව ගැන සඳහන් කරමින් පැවැසුවේය. මෙසේ ගුවන්විදුලි පණිවිඩ හුවමාරු ක්‍රමය මහාද්වීප අතර අරඹමින් මාකෝනි ඒ දස්කම කරන විට ඔහු 27 හැවිරිදි වියේ පසුවිය.

1907 දී අත්ලාන්තික් සාගරය හරහා මේ ක්‍රමයට පණිවිඩ හුවමාරු කර ගැනීමට මහජනතාවට ඉඩ ලැබිණ. ඉන් වසර දෙකකට පසු මාකෝනිට ඒ වෙනුවෙන් භෞතික විද්‍යාවට හිමි නොබෙල් ත්‍යාගය පිරිනැමිණ. එවර නොබෙල් ත්‍යාගය දෙදෙනකු අතර බෙදී ගියෙන් අනෙක් නොබෙල් ත්‍යාග ලාභියා වූයේ ජර්මන් භෞතික විද්‍යාඥයකු වූ ෆර්ඩිනන්ඩ් බ්‍රෝන් ය. ❑

## මාකෝනි ගුවන්විදුලි පණිවුඩය යැවූ හැටි

අත්ලාන්තික් සාගරය හරහා යැවූ ප්‍රථම ගුවන් විදුලි පණිවුඩය යැවුයේ 1901 දෙසැම්බර් 12 වැනිද ය. සියවසකට පෙර සිදුවූ ඒ සිද්ධිය නිසා පෘථිවියේ ගෝලාකාර බව නිසා පණිවුඩයක් අත්ලාන්තික් සාගරය හරහා යැවිය නොහැකි යැයි එතෙක් පැවති මතය බොරු විය.



ගුග්ලිඑල්මෝ මාකෝනි

පණිවුඩය : මෝස් සංඥා ක්‍රමය අනුව 'S' අකුර නිරූපණය සඳහා ... (තිත්) තුනකි.

ගුවන්විදුලි සංඥා අයනගෝලයේ (කි.මී 100 ක් පමණ ඉහළ අහසේ ආරෝපිත අයන අංශුස්තරයක) වැදී පහළට පරාවර්තනය වූ අයුරු.




නිව්ෆවුන්ඩ්ලන්තයේ සිග්නල්හිල් හී පණිවිඩ ලැබූ අය ටෙලිෆෝන කණුවකට යා කළ සරුංගලයක් මගින් පණිවුඩය ලබා ගනියි.

කෝන්වෝල්හි පොල්ධූ නම් ස්ථානයේ සිට වොට් 25,000 ක සම්ප්‍රේෂකයක් මගින් පණිවුඩය යවයි.

Source: Marconi

REUTERS